සැ. යු.- 2010.10.29 දින පළ වූ අංක 1,678 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවීය.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,679 - 2010 නොවැම්බර් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2010.11.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1736 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 නොවැම්බර් මස 12 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ඔක්තෝබර් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


1735 - B 80169— 7,100 (2010/11)
F1-(S/E)

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත**

සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය

**ලංසු කැඳවීමේ දැන්වීම**

***මහනුවර, මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් රෝහල් සඳහා පිසූ ආහාර සැපයීම - 2011 වර්ෂය***

ලංසු ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් සහ ආයතන - වර්ෂ 2011 ජනවාරි මස 01 වැනිදා සිට 2011 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා කාලය තුල (මෙම දින දෙක ඇතුලත්ව) මේ සමග ඇති 1, 2 සහ 3 වැනි උපලේඛනවල 1 වැනි තීරයේ සඳහන් වන ආයතනයන්ට පිසූ ආහාර සැපයීම සඳහා මධ්‍යම පළාතේ ස්ථිර පදිංචියක් ඇති ශ්‍රී ලාංකිකයන්ගෙන් හෝ ලියාපදිංචි කාර්යාලය හා මධ්‍යම පළාතේ පිහිටුවා ඇති ශ්‍රී ලාංකික සමාගම්, සමුපකාර හා අනුමත සමිති විසින් එවනු ලබන මුද්‍රා තබන ලද ලංසු පත්‍ර මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් භාරගනු ලැබේ.

2. *ලංසු ඉල්ලුම්පත්*.- ආපසු නොගෙවන රු. 500 ලංසු පෝරම ගාස්තුවක් හා උපලේඛනයේ 3වැනි තීරුවේ සඳහන් ආපසු ගෙවන තැන්පත් මුදල මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ මුදල් සහකාර වෙත ගෙවා පිසූ ආහාර සපයන ලංසු ඉල්ලුම්පත් ලබාගත හැකිය.

3. ලංසුපත් ඉල්ලුම් කරන අවස්ථාවේ දී මෙහි සඳහන් අනුමත සමිතිවලට ඉල්ලුම්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා 3.2 සිට 3.4 දක්වා වූ කොන්දේසි සපුරා තිබිය යුතුය.

3.1 අනුමත සමිති :-

(අ) සමෘද්ධි බලකාය,
(ආ) විවිධ සේවා සමුපකාර සමිතිය,
(ඇ) ග්‍රාම සංවර්ධන සමිතිය,
(ඈ) ලියාපදිංචි ගොවි සංවිධාන.

3.2 (අ) අදාල සමිතියේ බල ප්‍රදේශය තුල ආහාර සැපයීමට අදහස් කරන රෝහල පිහිටා තිබිය යුතු අතර ඒ බව සනාථ කිරීමට ප්‍රාදේශීය ලේකම්වරයාගේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

(ආ) (i) පිසූ ආහාර සැපයීම සම්බන්ධයෙන් ග්‍රාම සංවර්ධන සමිති සහ සමෘද්ධි බලකායන්හි මූල්‍ය තත්වය පිළිබඳව පිසූ ආහාර සැපයීම සඳහා යෝග්‍යතා සහතිකය ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් ලබාගත යුතුය.

(ii) ලියාපදිංචි ගොවි සංවිධාන ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙතින් ලබාගත් ලියාපදිංචි සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.

3.3 විවිධ සේවා සමුපකාර සමිතියකට ඉල්ලුම් කළ හැක්කේ තම බල ප්‍රදේශය තුළ පිහිටි රෝහල් සඳහා පමණි. මූල්‍ය තත්ත්වය පිළිබඳව අදාල බැංකුව වෙතින් නිකුත් කළ සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. (සමිතියේ නමින් වූ ගිණුමක මුදල් තැන්පත් කර ඇති බවට වන සහතිකයක්).

3.4 මෙම සියලුම ආයතනයන් තම ලියාපදිංචි වීමේ සහතිකය ඉදිරිපත් කළ යුතුයි.

3.5 ඉහත සඳහන් අනුමත සමිති සඳහා අනුග්‍රහයක් ලබා දෙන්නේ සමිති බල ප්‍රදේශය තුල අයදුම්කරන රෝහල පිහිටා තිබෙන්නේ නම් පමණි. එසේ නොවන්නේ නම් සාමාන්‍ය ලංසුකරුවන් සේ සලකා කටයුතු කරනු ලැබේ.

04. මෙම අනුමත සමිති සඳහා පමණක් 5% අනුග්‍රහයක් ලබාදෙනු ලැබේ.

05. *ලංසුපත්‍ර නිකුත් කිරීම*.- 2010 දෙසැම්බර් මස 01 දින පස්වරු 02.30 වන තුරු උපලේඛන අංක 1, 2 හා 3හි සඳහන් රෝහල් වෙනුවෙන් ලංසු පත්‍ර මහනුවර මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් නිකුත් කරනු ලැබේ.

06. *වත්කම් සහතික විස්තර*.- සියලුම ලංසුකරුවන් ලංසු ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේ දී තමාගේ පිළිගත හැකි වත්කම් පිළිබඳ 2010.09.01 වැනි දිනට පසුව මධ්‍යම පළාතේ පිහිටි දේපළක් සඳහා එම ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් පොදු 170 ආකෘතියෙන් ලබාගත් වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එය මාතලේ නාවලපිටිය දිස්ත්‍රික් මහ රෝහල් සඳහා ලක්ෂ 5ක් ද, දඹුල්ල දිස්ත්‍රික් මහ රෝහල සඳහා ලක්ෂ 3ක් ද, රිකිල්ලගස්කඩ, දික්ඔය, තෙල්දෙණිය යන දිස්ත්‍රික් මූලික රෝහළ සඳහා උඩුපුස්සැල්ලාව, වලපනේ, මස්කෙලිය, රත්තොට, ගලේවෙල ප්‍රාදේශීය රෝහල් සඳහා ලක්ෂ 02ක් ද, අනෙකුත් ප්‍රාදේශීය රෝහල් අකුරණ, අංකුඹුර, ගලගෙදර, කඩුගන්නාව, කටුගස්තොට, සංඝරාජපුර, දොලොස්බාගේ, දෙල්තොට, උඩදුම්බර, හසලක, මැණික්හින්න, මඩොල්කැලේ, පුස්සැල්ලාව, ලග්ගලපල්ලේගම, කොන්ගහවෙල හෙට්ටිපොල, නාලන්ද, මාදිපොල, ආගරපතන, ළිඳුල, වටවල, රම්බොඩ, බගවන්තලාව, කොටගල, මතුරට, ගෝනපිටිය යන රෝහල් සඳහා එක් ලක්ෂ පනස් දහසක් ද අනෙකුත් ප්‍රාදේශීය රෝහල් සඳහා රුපියල් හැත්තෑපන් දහසක් ද විය යුතුය. වත්කම් සහතිකයක් ඉදිරිපත් කිරීමට නොහැකිවන ඉල්ලුම්කරුවන්ට ලංසු ඉල්ලුම්පත් නිකුත් කරනු නොලැබේ. වත්කම් සහතිකයේ වටිනාකම අනුව ආහාර සැපයීම සහ ප්‍රවාහන කටයුතු සඳහා ලංසු ඉදිරිපත් කළ හැකි රෝහල් ප්‍රමාණය සීමා වේ.

07. වත්කම් සහතිකයේ මූල්‍ය වටිනාකම අනුව ආහාර සැපයීම සඳහා ලංසු ප්‍රදානය කරන රෝහල් ගණන සීමා වේ. මේ පිළිබඳව ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

08. දිස්ත්‍රික් මහා රෝහල්, දික්ඔය, තෙල්දෙණිය හා දඹුල්ල යන දිස්ත්‍රික් මූලික රෝහල් සහ වලපනේ, උඩුපුස්සැල්ලාව, මස්කෙලිය, රිකිල්ලගස්කඩ යන ප්‍රාදේශීය රෝහල් සඳහා ද ලංසු පත් ලබා ගැනීමේ දී පහත සඳහන් ලිපි ඉදිරිපත් කළ යුතුය :-

(අ) ව්‍යාපාර නාම ලියාපදිංචි සහතික,

(ආ) පසුගිය මාස 6ක කාලයට අදාල බැංකු ප්‍රකාශයක්,

(ඇ) ගබඩා සහ ප්‍රවාහන පහසුකම් පිළිබඳ ප්‍රකාශයක්.

09. *ලංසු ඇපකර.-* සියලුම රෝහල් සඳහා අංක 1, 2, 3 උපලේඛනවල 3 වැනි තීරයේ සඳහන් වටිනාකමින් යුත් ආපසු ගෙවන ලද ඇපයක් ලංසුකරුවන් විසින් ලංසුපත් ලබා ගැනීමේ දී මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ මුදල් සහකාර වෙත මුදලින් ගෙවා රිසිට් පතක් ලබා ගත යුතුය.

3.1 හි සඳහන් අනුමත සමිති 3.2 (අ) සඳහන් නියමයන්ට අනුකූල නම් පමණක් මෙහි මුදලින් තබන ඇපය අවශ්‍ය නොවේ. එහි 3.5 සඳහන් නියමයන්ට අනුකූල නම් ඇප තැබීමක් අවශ්‍ය වේ.

10. (අ) *ප්‍රමාණයන්.-* (1) සැපයිය යුතු අවශ්‍ය ආහාරවල දළ ප්‍රමාණයන් මේ සමග ඇති 1, 2, 3 උපලේඛනයන්හි 6 වැනි තීරයේ ද 4, 5 හා 6 උපලේඛනයන්හි 5 තීරයේ ද දක්වා තිබේ. මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී රෝගීන් සඳහා සම්පූර්ණ ආහාර වටයක් සඳහා මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. (සම්පූර්ණ ආහාර වටයක් යනු රාත්‍රී උදේ, දිවා යන ආහාර වේල් 03 ඇතුළත් ය.)

(ආ) සියලුම වර්ගයේ ආහාර වටයකට, අළුත් මාළු, කුකුල් මස්, කරවල, බිත්තර, පරිප්පු සමග එළවළු සඳහා මිළ ප්‍රමාණයන් ලංසුකරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය.

සමහරවිට පිරිමැසුම් ක්‍රමයක් වශයෙන් එක් ආහාර වටයක් වෙනුවට වෙනත් ආහාර වටයක් ලබාදීමට දෙපාර්තමේන්තුව මගින් තීරණය කළ හැක. එනම් බිත්තර ආහාර වටයක් වෙනුවට මස් ආහාර වටයක් හෝ අලුත් මාළු ආහාර වටයක් හෝ කරවල ආහාර වටයක් එය වඩා ලාභ වේ නම් ඇණවුම් කළ හැක. කෙසේ වෙතත් බිත්තර, මස්, මාළු හෝ කරවල ආහාර වටයක් වෙනුවට එළවලු ආහාර වටයක් ඇණවුම් කළ නොහැකිය. දිවා භෝජනය සඳහා බිත්තර හෝ මස් හෝ මාළු හෝ කරවල ද රාත්‍රී භෝජනය සඳහා පරිප්පු සමග එළවළු ද අවශ්‍ය වන බව කොන්ත්‍රාත්කරුවන් විසින් දැනගත යුතු වන අතර, එකී පරිදි ආහාරවට සැපයීමට කොන්ත්‍රාත්කරුවන් සූදානම් විය යුතුය. එමෙන්ම උදේ ආහාර සඳහා සතියේ එක් එක් දින රතු කැකුළු බත් සමග පරිප්පු (නොපිසූ සහල් ග්‍රෑම් 75ක් පරිප්පු ග්‍රෑම් 15) කිරිබත් සමග ලුණු මිරිස් (සහල් ග්‍රෑම් 75) මුංඇට සමඟ ලුණුමිරිස් (මුංඇට ග්‍රෑම් 90ක්) පාන් ග්‍රෑම් 120ක් කෙසෙල් ගෙඩි 01ක් සමග කඩල ලුණුමිරිස් සමඟ (කඩල ග්‍රෑම් 90ක්) ඉතිරි දින සඳහා පාන් හැර වෙනත් පෝෂ්‍යදායී අවම පිරිවැයක් ඇති ආහාර වටයක් සැපයීමට කොන්ත්‍රාත්කරුවන් සූදානම් විය යුතුය.

(ඇ) රෝගීන්ට සම්පූර්ණ ආහාර වටයක් සඳහා උදේ, දහවල්, රාත්‍රී ආහාර (වේල් 03ක්) සැපයිය යුතුය.

(ඈ) දිගන පුනරුත්ථාපන රෝහලේ නේවාසික රෝගීන් සඳහා උපලේඛන අංක 04-05 හි සඳහන් පරිදි ආහාර සැපයීමට මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

(ඉ) මාතලේ රෝහලේ ක්ෂය රෝගීන් සඳහා අංක 06 හි සඳහන් පරිදි ආහාර සැපයීමට මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

11. *ලංසු එවිය යුතු අන්දම.-* සියලුම ලංසුපත් පිටපත් දෙකකින් සකස් කර මුල් පිටපත හා දෙවන පිටපත වෙන් වෙන්ව කවරවල මුද්‍රා තබා එක කවරයක බහා මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, තැ. පෙ. 163, සංඝරාජ මාවත, මහනුවර වෙත එවිය යුතුය. මුද්‍රා තබන ලද ලංසුපත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙලවරේ "2011............................දිස්ත්‍රික්කයේ.....................................රෝහලට ආහාර ද්‍රව්‍ය සැපයීම සඳහා වූ ලංසු" යනුවෙන් අදාල වන පරිදි ආයතනය සඳහන් කර එවිය යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙලවරේ ලංසුකරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. ලංසු පත්‍රිකා ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ඒ සඳහා මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියට දැමීමට පුළුවන. ලංසුපත් තැපෑලෙන් එවීමේ දී සිදුවන ප්‍රමාද දෝෂයන් ගැන වග කියනු නොලැබේ.

12. *ලංසුපත් භාරගැනීම.-* මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයීය දින මුද්‍රා තබන ලද ලංසුපත් 2010 දෙසැම්බර් මස 02 දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ. එදිනම පෙ. ව. 11.00ට ලංසුපත් විවෘත කරනු ලැබේ.

13. *ලංසුපත්‍ර විවෘත කිරීම.-* ලංසු පත්‍ර විවෘත කරන වේලාවට ලංසුකරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක.

14. *ලංසු තීරණය.-* ලංසුවක් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ලංසුකරු විසින් ආකෘති පත්‍රයේ "අ" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිල ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුව ය.

එසේ වුවත් ලංසු පත්‍රයේ "ආ" උපලේඛනයට අයත් ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ලංසු පත්‍රයේ සඳහන් මිල ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් ඉදිරිපත් කරනු ලබන මිළ ගණන් යන තුනෙන් අඩු ගණන ගෙවනු ලැබේ. පාලන මිළ පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ. තව ද මෙම ආහාර ප්‍රසම්පාදන පටිපාටියට රජය විසින් විටින් විට පනවනු ලබන රෙගුලාසි, බදු සහ අනපනත්වලට යටත් කරනු ලැබේ. ලංසු පිරිනැමීමේ තීරණය ගනු ලබන්නේ මධ්‍යම පළාත් සෞඛ්‍ය ලේකම්/මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ/අදාල නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයීය ප්‍රසම්පාදන මණ්ඩලය විසිනි. මෙයට අමතරව 2007 වර්ෂයේ සිට මසකට රුපියල් 50,000ක වටිනාකම ඉක්මවන බිල්පත්වලින් 5% රඳවුම් බද්දක් අය කරනු ලැබේ. එය දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කෙරේ.

15. මහනුවර දිස්ත්‍රික්කයේ නාවලපිටියේ දිස්ත්‍රික් මහ රෝහල සහ දිගන පුනරුත්ථාපන රෝහල් සඳහා ද මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ දිස්ත්‍රික් මහ රෝහල සඳහා සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ දික්ඔය දිස්ත්‍රික් මූලික රෝහල හා මස්කෙලිය ප්‍රාදේශීය රෝහල සඳහා ද ආහාර පිසීමේ දී ගෑස් භාවිතා කළ යුතු වේ. ඒ අනුව ආහාර සැපයීමේ මිළ ගණන් ඉදිරිපත් කිරීමේ දී මේ පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.

16. *ලංසු සඳහන් කරන මිළ ගණන් වලංගු කාල සීමාව.-* ලංසුකරුවන් විසින් සඳහන් කරන මිළ ගණන් පළමුවැනි ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

17. *ඇප තැන්පත් මුදල.-* තෝරාගන්නා ලද ලංසුකරු මෙහි ගිවිසුම් පත්‍රය අත්සන් තැබිය යුතුයි. ඊට අමතරව ලංසුවේ වටිනාකමින් 10%ක් වටිනා ඇප බැඳුම්කරයක් (ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක මහ බැංකුව පිළිගත් බැංකුවකින්) ඉදිරිපත් කළ යුතුයි. අදාල පළමු මාසය තුළ ඉහත ගිවිසුමට එළඹීමට අපොහොසත් වන කොන්ත්‍රාත්කරුවන්ට කිසිදු ගෙවීමක් නොකරන අතර කොන්ත්‍රාත්තුව පැහැර හැරියා සේ සලකා අසාදු ලේඛනයට ඇතුළත් කරන බව දන්වමි.

18. *බඩුබාහිරාදිය තබා ගැනීම.-* තෝරාගත් ලංසුකරුවන්ගේ බඩුබාහිරාදිය ගබඩාකර තැබීම සඳහා ආයතනය හෝ එහි පිහිටි ඉඩම් තුළ ඉඩකඩ සලස්වා දෙනු නොලැබේ.

19. *ලංසු පිළිබඳ කොන්දේසි.-* ලංසු පිළිබඳ කොන්දේසි ලංසුපත්‍රයේ පිටුපස දක්වා ඇත. ලංසුකරුවන් එම කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු ද වන්නේ ය.

20. *සැපයිය යුතු හාල් ප්‍රමාණ සහ වර්ග.-* ලංසුකරුවන් විසින් දක්වා ඇති මිළ ගණන් අනුව රෝගීන්ට එක් ආහාර වේලකට ග්‍රෑම් 100 බැගින් ද බත් ආහාර වේල් 2 ක් සඳහා සහල් සැපයිය යුතුයි. බත් සඳහා රතු කැකුළු හාල් පමණක් සැපයිය යුතුයි.

21. අසාදු ලේඛනගත කර ඇති කොන්ත්‍රාත්කරුවනට සහ සමිතිවලට ද ලංසු පත් නිකුත් කරනු නොලැබේ. ලංසු සම්බන්ධව ප්‍රසම්පාදන මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය බව දන්වමි.

වෛද්‍ය ශාන්ති සමරසිංහ,
මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

2010 ඔක්තෝබර් මස 18 වැනි දින,
තැ. පෙ. 163, සංඝරාජ මාවතෙහි පිහිටි මධ්‍යම පළාත්
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දී ය.

*උපලේඛන අංක - 1*

**2011 වර්ෂය සඳහා පිසූ ආහාර සැපයීම - මහනුවර දිස්ත්‍රික්කය**

| 1 | 2 | 3 | 4 | 5 | 6 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| *ආයතනය* | *ලංසු පෝරම ගාස්තු* | *ඇප මුදල්* | *වත්කම් සහතිකවල වටිනාකම* | *ලංසු භාර ගන්නා අවසාන දිනය* | *ආහාර ප්‍රමාණය දල වශයෙන් රෝගීන්ට* | | | | |
| | | | | | *අලුත් මාළු* | *කුකුල් මස්* | *කරවල* | *එළවළු* | *බිත්තර* |
| 1. දිස්ත්‍රික් මහරෝහල-නාවලපිටිය | 500 | 5,000 | 5,00,000 | 2010 දෙසැම්බර් මස 02 වැනි දින පෙ. ව. 10.30 | 6,791 | 7,727 | 7,536 | 7,446 | 23,421 |
| 2. දිස්ත්‍රික් මූලික රෝහල-තෙල්දෙණිය | 500 | 3,000 | 2,00,000 | | 1,050 | 1,120 | 1,080 | 1,200 | 3,140 |
| *ප්‍රාදේශීය රෝහල් :* | | | | | | | | | |
| 3. අකුරණ | 500 | 2,000 | 1,50,000 | | 1,160 | 1,080 | 1,080 | 1,120 | 3,380 |
| 4. අංකුඹුර | 500 | 2,000 | 1,50,000 | | 860 | 850 | 940 | 860 | 2,680 |
| 5. දෙල්තොට | 500 | 2,000 | 1,50,000 | | 800 | 880 | 960 | 900 | 2,680 |
| 6. දොලොස්බාගේ | 500 | 2,000 | 1,50,000 | | 180 | 120 | 180 | 240 | 540 |
| 7. ගලගෙදර | 500 | 2,000 | 1,50,000 | | 740 | 630 | 1,180 | 880 | 1,240 |
| 8. මැණික්හින්න | 500 | 2,000 | 1,50,000 | | 900 | 1,020 | 940 | 1,000 | 1,660 |
| 9. මඩොල්කැලේ | 500 | 2,000 | 1,50,000 | | 1,620 | 1,910 | 1,840 | 1,870 | 5,040 |
| 10. පුස්සැල්ලාව | 500 | 2,000 | 1,50,000 | | 750 | 720 | 660 | 640 | 1,740 |
| 11. උඩුදුම්බර | 500 | 2,000 | 1,50,000 | | 740 | 900 | 810 | 840 | 2,260 |

| 1 | 2 | 3 | 4 | 5 | 6 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආයතනය | ලංසු පෝරම ගාස්තු | ඇප මුදල් | වත්කම් සහතික වල වටිනාකම | ලංසු භාර ගන්නා අවසාන දිනය | ආහාර ප්‍රමාණය දල වශයෙන් රෝගීන්ට | | | | |
| | | | | | අලුත් මාළු | කුකුල් මස් | කරවල | එළවළු | බිත්තර |
| 12. කඩුගන්නාව | 500 | 2,000 | 1,50,000 | 2010 දෙසැම්බර් මස 02 වැනි දින පෙ. ව. 10.30 | 760 | 700 | 740 | 740 | 2,090 |
| 13. කටුගස්තොට | 500 | 2,000 | 1,50,000 | | 740 | 720 | 880 | 1,190 | 1,380 |
| 14. හසලක | 500 | 2,000 | 1,50,000 | | 900 | 940 | 960 | 940 | 2,405 |
| 15. සංඝරාජපුර | 500 | 2,000 | 1,50,000 | | 330 | 330 | 330 | 310 | 870 |
| 16. මාම්පිටිය | 500 | 1,000 | 75,000 | | 640 | 660 | 670 | 610 | 1,680 |
| 17. මාරස්සන | 500 | 1,000 | 75,000 | | 800 | 910 | 820 | 870 | 2,250 |
| 18. මැදවල | 500 | 1,000 | 75,000 | | 380 | 310 | 640 | 1,300 | 1,200 |
| 19. මිණිපේ | 500 | 1,000 | 75,000 | | 960 | 540 | 520 | 450 | 1,000 |
| 20. වත්තේගම | 500 | 1,000 | 75,000 | | 700 | 740 | 680 | 760 | 1,960 |
| 21. පන්විලතැන්න | 500 | 1,000 | 75,000 | | 375 | 327 | 500 | 435 | 750 |
| 22. තිත්තපජ්ජල | 500 | 1,000 | 75,000 | | 710 | 710 | 770 | 720 | 2,020 |
| 23. අළුත්ගම ජම්බුගහපිටිය | 500 | 1,000 | 75,000 | | 600 | 540 | 1,380 | 510 | 460 |
| 24. අඹගහපැලැස්ස | 500 | 1,000 | 75,000 | | 640 | 420 | 1,010 | 440 | 440 |
| 25. බටුමුල්ල | 500 | 1,000 | 75,000 | | 310 | 250 | 260 | 260 | 730 |
| 26. බඹරදෙනිය | 500 | 1,000 | 75,000 | | 270 | 230 | 260 | 240 | 460 |
| 27. බොක්කාවල | 500 | 1,000 | 75,000 | | 760 | 900 | 730 | 820 | 2,160 |
| 28. ගලහා | 500 | 1,000 | 75,000 | | 560 | 550 | 1,040 | 560 | 1,080 |
| 29. ගල්පිහිල්ල | 500 | 1,000 | 75,000 | | 390 | 360 | 410 | 440 | 1,100 |
| 30. ගෙලිඔය | 500 | 1,000 | 75,000 | | 350 | 410 | 390 | 1,040 | 1,170 |
| 31. හතරලියද්ද | 500 | 1,000 | 75,000 | | 400 | 420 | 930 | 400 | 400 |
| 32. කහවත්ත | 500 | 1,000 | 75,000 | | 130 | 140 | 160 | 180 | 320 |
| 33. කොළොන්ගොඩ | 500 | 1,000 | 75,000 | | 570 | 550 | 560 | 570 | 1,500 |
| 34. කොටලිගොඩ | 500 | 1,000 | 75,000 | | 790 | 760 | 2,200 | 750 | 760 |
| 35. කුරුඳුවත්ත | 500 | 1,000 | 75,000 | | 700 | 770 | 700 | 1,840 | 2,070 |
| 36. මැදමහනුවර | 500 | 1,000 | 75,000 | | 330 | 370 | 360 | 390 | 900 |
| 37. මොරහේන | 500 | 1,000 | 75,000 | | 160 | 168 | 180 | 200 | 440 |
| 38. නාරම්පනාව | 500 | 1,000 | 75,000 | | 330 | 390 | 360 | 350 | 900 |
| 39. පමුණුව | 500 | 1,000 | 75,000 | | 360 | 320 | 440 | 430 | 630 |
| 40. තලාතුඔය | 500 | 1,000 | 75,000 | | 540 | 640 | 760 | 600 | 1,000 |
| 41. උඩගම අටබාගේ | 500 | 1,000 | 75,000 | | 180 | 140 | 160 | 180 | 460 |
| 42. උඩුවෙල | 500 | 1,000 | 75,000 | | 450 | 430 | 300 | 410 | 1,040 |
| 43. වට්ටප්පල | 500 | 1,000 | 75,000 | | 630 | 660 | 1,060 | 640 | 1,040 |
| 44. යග්ගහපිටිය | 500 | 1,000 | 75,000 | | 360 | 390 | 900 | 320 | 380 |
| 45. දූන්හින්න | 500 | 1,000 | 75,000 | | 130 | 140 | 160 | 180 | 320 |
| 46. උලපනේ | 500 | 1,000 | 75,000 | | 400 | 420 | 390 | 460 | 1,000 |
| 47. පට්ටියගම පල්ලේගම | 500 | 1,000 | 75,000 | | 360 | 330 | 580 | 380 | 530 |
| 48. මුරුතලාව | 500 | 1,000 | 75,000 | | 330 | 350 | 520 | 240 | 470 |
| 49. වෙස්ට්හෝල්-නාවලපිටිය | 500 | 1,000 | 75,000 | | 340 | 240 | 220 | 160 | 260 |
| 50. දිගන පුනරුත්ථාපන රෝහල | 500 | 3,000 | 2,00,000 | අංක 4, 5 උපලේඛන අනුව ආහාර සැපයිය යුතුයි. | | | | | |
| 51. සිසිල පුනරුත්ථාපන රෝහල | 500 | 1,000 | 75,000 | අමු ආහාර ලේඛනයක් සපයනු ලැබේ. | | | | | |

**උපලේඛන අංක - 2**

2011 වර්ෂය සඳහා පිසූ ආහාර සැපයීම - මාතලේ දිස්ත්‍රික්කය

| 1 | 2 | 3 | 4 | 5 | 6 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආයතනය | ලංසු පෝරම ගාස්තු | ඇප මුදල් | වත්කම් සහතික වල වටිනාකම | ලංසු භාර ගන්නා අවසාන දිනය | ආහාර ප්‍රමාණය දල වශයෙන් රෝගීන්ට | | | | |
| | | | | | අලුත් මාළු | කුකුල් මස් | කරවල | එළවළු | බිත්තර |
| 1. දිස්ත්‍රික් මහරෝහල-මාතලේ | 500 | 5,000 | 5,00,000 | 2010 දෙසැම්බර් මස 02 වැනි දින පෙ. ව. 10.30 | 19,300 | 9,650 | 9,650 | 9,650 | 19,300 |
| 2. දිස්ත්‍රික් මූලික රෝහල-දඹුල්ල | 500 | 4,000 | 3,00,000 | | 4,800 | 2,650 | 2,450 | 2,450 | 4,800 |
| ප්‍රාදේශීය රෝහල් : | | | | | | | | | |
| 3. රත්තොට | 500 | 3,000 | 2,00,000 | | 2,500 | 1,250 | 1,250 | 1,250 | 2,500 |
| 4. ගලේවෙල | 500 | 3,000 | 2,00,000 | | 2,500 | 1,250 | 1,250 | 1,250 | 2,500 |
| 5. ලග්ගල පල්ලේගම | 500 | 2,000 | 1,50,000 | | 2,400 | 1,200 | 1,200 | 1,200 | 2,400 |
| 6. මාදිපොල | 500 | 2,000 | 1,50,000 | | 1,600 | 800 | 800 | 800 | 1,600 |
| 7. නාලන්ද | 500 | 2,000 | 1,50,000 | | 1,600 | 800 | 800 | 800 | 1,600 |
| 8. කෝන්ගහවෙල | 500 | 2,000 | 1,50,000 | | 2,500 | 1,250 | 1,250 | 1,250 | 2,500 |
| 9. හෙට්ටිපොල | 500 | 2,000 | 1,50,000 | | 3,200 | 1,600 | 1,600 | 1,600 | 3,200 |
| 10. හඳුන්ගමුව | 500 | 1,000 | 75,000 | | 600 | 300 | 300 | 300 | 600 |
| 11. ඕවිලිකන්ද | 500 | 1,000 | 75,000 | | 900 | 450 | 450 | 450 | 900 |
| 12. මාරක | 500 | 1,000 | 75,000 | | 300 | 150 | 150 | 150 | 300 |
| 13. හත්තොට අමුණ | 500 | 1,000 | 75,000 | | 600 | 300 | 300 | 300 | 600 |
| 14. ලෙනදොර | 500 | 1,000 | 75,000 | | 300 | 150 | 150 | 150 | 300 |
| 15. යටවත්ත | 500 | 1,000 | 75,000 | | 600 | 300 | 300 | 300 | 600 |
| 16. මුවන්දෙණිය | 500 | 1,000 | 75,000 | | අමු ආහාර ලේඛනයක් සපයනු ලැබේ. | | | | |
| 17. ඉලුක්කුඹුර | 500 | 1,000 | 75,000 | | 300 | 150 | 150 | 150 | 300 |
| 18. ලෑලි අඹේ | 500 | 1,000 | 75,000 | | අමු ආහාර ලේඛනයක් සපයනු ලැබේ. | | | | |
| 19. කිඹිස්ස සීගිරිය | 500 | 1,000 | 75,000 | | 600 | 300 | 300 | 300 | 600 |

**උපලේඛන අංක - 3**

2011 වර්ෂය සඳහා පිසූ ආහාර සැපයීම - නුවරඑළිය දිස්ත්‍රික්කය

| 1 | 2 | 3 | 4 | 5 | 6 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආයතනය | ලංසු පෝරම ගාස්තු | ඇප මුදල් | වත්කම් සහතික වල වටිනාකම | ලංසු භාර ගන්නා අවසාන දිනය | ආහාර ප්‍රමාණය දල වශයෙන් රෝගීන්ට | | | | |
| | | | | | අලුත් මාළු | කුකුල් මස් | කරවල | එළවළු | බිත්තර |
| 1. දිස්ත්‍රික් මූලික රෝහල - දික්ඔය | 500 | 3,000 | 2,00,000 | 2010 දෙසැම්බර් මස 02 වැනි දින පෙ. ව. 10.30 | 3,027 | 12,382 | 2,322 | 2,254 | 7,965 |
| 2. දිස්ත්‍රික් මූලික රෝහල-රිකිල්ලගස්කඩ | 500 | 3,000 | 2,00,000 | | 960 | 954 | 654 | 1,008 | 2,514 |

**2011 වර්ෂය සඳහා පිසූ ආහාර සැපයීම - නුවරඑළිය දිස්ත්‍රික්කය *(සම්බන්ධිතයි)***

| 1 | 2 | 3 | 4 | 5 | 6 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| *ආයතනය* | *ලංසු පෝරම ගාස්තු* | *ඇප මුදල්* | *වත්කම් සහතික වල වටිනාකම* | *ලංසු භාර ගන්නා අවසාන දිනය* | *ආහාර ප්‍රමාණය දල වශයෙන් රෝගීන්ට* | | | | |
| | | | | | *අලුත් මාළු* | *කුකුල් මස්* | *කරවල* | *එළවළු* | *බිත්තර* |
| *ප්‍රාදේශීය රෝහල් :* | | | | | | | | | |
| 3. වලපනේ | 500 | 3,000 | 2,00,000 | 2010 දෙසැම්බර් මස 02 වැනි දින පෙ. ව. 10.30 | 930 | 936 | 1,191 | 1,005 | 3,357 |
| 4. උඩුපුස්සැල්ලාව | 500 | 3,000 | 2,00,000 | | 1,212 | 912 | 1,008 | 1,014 | 3,090 |
| 5. මස්කෙළිය | 500 | 3,000 | 2,00,000 | | 1,086 | 1,092 | 984 | 924 | 2,832 |
| 6. ආගරපතන | 500 | 2,000 | 1,50,000 | | 648 | 648 | 780 | 696 | 1,920 |
| 7. ලිඳුල | 500 | 2,000 | 1,50,000 | | 816 | 1,325 | 972 | 1,098 | 3,120 |
| 8. වටවල | 500 | 2,000 | 1,50,000 | | 876 | 1,176 | 846 | 876 | 3,156 |
| 9. රම්බොඩ කොත්මලේ | 500 | 2,000 | 1,50,000 | | 1,356 | 1,548 | 1,446 | 1,716 | 4,686 |
| 10. බගවන්තලාව | 500 | 2,000 | 1,50,000 | | 1,308 | 966 | 1,068 | 1,296 | 3,492 |
| 11. කොටගල | 500 | 2,000 | 1,50,000 | | 1,110 | 756 | 1,734 | 954 | 1,734 |
| 12. මතුරට | 500 | 2,000 | 1,50,000 | | 810 | 756 | 678 | 708 | 2,400 |
| 13. මල්දෙණිය | 500 | 1,000 | 75,000 | | 276 | 276 | 512 | 264 | 552 |
| 14. ලක්ෂපාන | 500 | 1,000 | 75,000 | | 774 | 642 | 576 | 612 | 2,046 |
| 15. ගිණිගත්හේන | 500 | 1,000 | 75,000 | | 228 | 168 | 288 | 324 | 924 |
| 16. හඟුරන්කෙත | 500 | 1,000 | 75,000 | | 576 | 636 | 432 | 1,104 | 1,032 |
| 17. ඩයගම | 500 | 1,000 | 75,000 | | 346 | 432 | 870 | 576 | 966 |
| 18. ගෝනපිටිය | 500 | 1,000 | 75,000 | | 72 | 96 | 216 | 120 | 300 |
| 19. උතුරුමැද කුඹුර | 500 | 1,000 | 75,000 | | 432 | 276 | 852 | 408 | 660 |
| 20. හයිපොරස්ට් | 500 | 1,000 | 75,000 | | 612 | 582 | 312 | 492 | 1,182 |
| 21. ගෝනගන්තැන්න | 500 | 1,000 | 75,000 | | 336 | 384 | 288 | 228 | 732 |
| 22. මුල්ඔය | 500 | 1,000 | 75,000 | | 612 | 582 | 312 | 492 | 1,182 |
| *ප්‍රාථමික වෛද්‍ය ඒකකය :* | | | | | | | | | |
| 23. නිල්දණ්ඩාහින්න | 500 | 1,000 | 75,000 | | 102 | 216 | 114 | 156 | 384 |
| 24. මන්දරාම්නුවර | 500 | 1,000 | 75,000 | | 48 | 12 | 72 | 108 | 132 |

**උපලේඛන අංක - 4**

දිගන පුනරුත්ථාපන රෝහලේ දිගුකාලීනව ප්‍රතිකාර ලබන ආබාධිත රෝගීන් සඳහා ආහාර වටය

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| *සතියේ දින* | *උදේ* | *දහවල්* | *රාත්‍රී* | *ආහාර වටයන්* |
| ඉරිදා | මුංඇට<br>ලුණු මිරිස්<br>පොල් | බත්<br>අළුත් මාළු<br>ගෙඩි එළවළුවක්<br>නිවිති වැනි කොල කරියක් | බත්<br>කැරට්<br>කංකුං මැල්លුමක් | 2600 |
| සඳුදා | පාන් සමඟ ජෑම් | කහ බත්<br>අර්තාපල්<br>සැමන් කරියක්<br>ලූණු බැදුමක් | බත්<br>බෝංචි එළවළුවක්<br>පලා මැල්ලුමක් | 2550 |

දිගන පුනරුත්ථාපන රෝහලේ දිගුකාලීනව ප්‍රතිකාර ලබන ආබාධිත රෝගීන් සඳහා ආහාර වටය *(සම්බන්ධිතයි)*

| *1* | *2* | *3* | *4* | *5* |
|---|---|---|---|---|
| *සතියේ දින* | *උදේ* | *දහවල්* | *රාත්‍රී* | *ආහාර වටයන්* |
| අඟහරුවාදා | කිරිබත් සමග<br>ලුණු මිරිස් | බත්<br>ගෙඩි එළවළුවක්<br>පරිප්පු කරියක්<br>කරවල බැදුමක් | පාන්<br>කිරිහොදි හෝ<br>තක්කාලි හොදි සමග | 2600 |
| බදාදා | මුංඇට සමග<br>ලුණු මිරිස් | බත්<br>අළුත් මාළු<br>ගෙඩි එළවළුවක්<br>පළා මැල්ලුමක් | බත්<br>ගෙඩි එළවළුවක්<br>පිපිඤ්ඤා සලාදයක්<br>හෝ තක්කාලි සලාදයක් | 2600 |
| බ්‍රහස්පතින්දා | පාන්<br>පරිප්පු හොදි සමග | කහ බත්<br>කුකුල් මස්<br>අර්තාපල් සුදු කරියක් | බත්<br>ගෙඩි එළවළුවක්<br>පලා මැල්ලුමක් | 2600 |
| සිකුරාදා | බනිස් 2ක් සමග<br>කෙසෙල් ගෙඩි 1 | බත්<br>ගෙඩි එළවළුවක්<br>සැමන්<br>බෝංචි එළවළුවක්<br>පලා මැල්ලුමක් | නූඩ්ල්ස්<br>අර්තාපල් හෝ පරිප්පු<br>කරියක්<br>බිත්තර 1 | 2600 |
| සෙනසුරාදා | පාන්<br>පොල් සම්බෝල | බත්<br>ලංකා පරිප්පු<br>බීට් රූට්<br>පලා මැල්ලුමක් | බත්<br>කරවල බැදුමක්<br>ගෙඩි එළවළුවක්<br>පලා මැල්ලුමක් | 2650 |

**උපලේඛන අංක - 5**

දිගන පුනරුත්ථාපන රෝහලේ දිගුකාලීනව ප්‍රතිකාර ලබන ආබාධිත ළමුන් සඳහා ආහාර වටය

වයස අවුරුදු 06 සිට 12 අතර එස් - 1<br>
වයස අවුරුදු 02 සිට 06 අතර එස් - 2<br>
වයස මාස 09 සිට අවුරුදු 02 අතර එස් - 3<br>
ලෙස දක්වා ඇත.

| *1* | *2* | *3* | *4* | *5* |
|---|---|---|---|---|
| *සතියේ දින* | *උදේ* | *දහවල්* | *රාත්‍රී* | *ආහාර වටයන්* |
| ඉරිදා | මුංඇට<br>පොල්<br>කෙසෙල් ගෙඩි 1 | රතු කැකුළු බත්<br>අළුත් මාළු කිරට<br>මුකුණුවැන්න මැල්ලුම<br>බතල | නූඩ්ල්ස්<br>පරිප්පු කිරට<br>කෙසෙල් ගෙඩි | 520 |
| සඳුදා | කඩල<br>පොල්<br>පැපොල් | කහ බත්<br>බිත්තර<br>කිරි හොදි | පාන් බටර්<br>බිත්තර | 510 |
| අඟහරුවාදා | කිරිබත් සමග<br>කෙසෙල් ගෙඩි 1 | රතු කැකුළු බත්<br>පරිප්පු කිරට<br>ගොටුකොළ සම්බල්<br>කරවල | පාන් බටර්<br>කිරි හොදි<br>කෙසෙල් ගෙඩි | 520 |

දිගන පුනරුත්ථාපන රෝහලේ දිගුකාලීනව ප්‍රතිකාර ලබන ආබාධිත ළමුන් සඳහා ආහාර වට්ටෝරුව *(සම්බන්ධිතයි)*

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| *සතියේ දින* | *උදේ* | *දහවල්* | *රාත්‍රී* | *ආහාර වටයන්* |
| බදාදා | කඩල<br>පොල්<br>පැපොල් | රතු කැකුළු බත්<br>අළුත් මාළු කිරට<br>වට්ටක්කා<br>පළා මැල්ලුමක් | රතු කැකුළු බත්<br>අල හොදි<br>මුකුණුවැන්න මැල්ලුම | 520 |
| බ්‍රහස්පතින්දා | පාන්<br>ජෑම්<br>පැපොල් | කහ බත්<br>කුකුල් මස්<br>අර්තාපල් සුදු කරියක් | පාන් බටර්<br>කෙසෙල් ගෙඩි | 520 |
| සිකුරාදා | කව්පි<br>පොල්<br>පැපොල් | රතු කැකුළු බත්<br>ගෙඩි එළවළුවක්<br>බෝංචි<br>පළා මැල්ලුමක්<br>බිත්තර | නූඩ්ල්ස්<br>අර්තාපල් හොදි<br>පැපොල් | 520 |
| සෙනසුරාදා | බනිස්<br>කෙසෙල් ගෙඩි 1 | රතු කැකුළු බත්<br>පරිප්පු<br>බීට් රූට්<br>පළා මැල්ලුමක් | රතු කැකුළු බත්<br>කැරට්<br>කරවල<br>පළා මැල්ලුමක් | 530 |

දවසට දෙවරක් උදේ සහ සවස කිරි සැපයිය යුතු අතර ඒ සඳහා අවශ්‍ය කිරිපිටි සහ සීනි ප්‍රමාණය ආ. ඇමුණුමේ දක්වා ඇත.
එස්. 1 එස්. 2 එස්. 3 සඳහා ඇණවුම් කළ යුතු අමු ආහාර ප්‍රමාණය 'අ' සහ 'ආ' ඇමුණුම්වල දක්වා ඇත.

**උපලේඛන අංක - 6**

මාතලේ මහ රෝහලේ ක්ෂය රෝගීන් සඳහා ආහාර වටයන් පිළිබඳ විස්තර

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| *සතියේ දින* | *උදේ* | *දහවල්* | *රාත්‍රී* | *ආහාර වටයන්* |
| ඉරිදා | මුංඇට<br>ලුණු මිරිස්<br>පොල් | බත්<br>අළුත් මාළු<br>ගෙඩි එළවලුවක්<br>නිවිති වැනි කොල කරියක් | බත්<br>කැරට්<br>කංකුං මැල්ලුමක්<br>බිත්තර 1ක් | 3600 |
| සඳුදා | පාන් සමඟ ජෑම් | කහ බත්<br>අර්තාපල්<br>සැමන් කරියක්<br>එළු බැදුමක් | බත්<br>බෝංචි එළවලුවක්<br>පළා මැල්ලුමක්<br>බිත්තර 1ක් | 3600 |
| අඟහරුවාදා | කිරිබත් සමග<br>ලුණු මිරිස් | බත්<br>ගෙඩි එළවලුවක්<br>පරිප්පු කරියක්<br>කරවල බැදුමක් | පාන්<br>කිරි හොදි හෝ<br>තක්කාලි හොදි සමග<br>බිත්තර 1ක් | 3600 |
| බදාදා | මුංඇට සමග<br>ලුණු මිරිස් | බත්<br>අළුත් මාළු<br>ගෙඩි එළවළුවක්<br>පළා මැල්ලුමක් | බත්<br>ගෙඩි එළවළුවක්<br>පිපිඤ්ඤා සලාදයක්<br>හෝ තක්කාලි සලාදයක්<br>බිත්තර 1ක් | 3600 |

මාතලේ මහ රෝහලේ ක්ෂය රෝගීන් සඳහා ආහාර වට්ටෝරු පිළිබඳ විස්තර (සම්බන්ධිතයි)

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| *සතියේ දින* | *උදේ* | *දහවල්* | *රාත්‍රී* | *ආහාර වට්ටෝරු* |
| බ්‍රහස්පතින්දා | පාන්<br>පරිප්පු හොදි සමග | කහබත්<br>කුකුල් මස්<br>අර්තාපල් සුදු කරියක් | බත්<br>ගෙඩි එළවලුවක්<br>පලා මැල්ලුමක්<br>බිත්තර 1ක් | 3600 |
| සිකුරාදා | බනිස් 2ක් සමග<br>කෙසෙල් ගෙඩි 1 | බත්<br>ගෙඩි එළවළුවක්<br>සැමන්<br>බෝංචි එළවළුවක්<br>පලා මැල්ලුමක් | නූඩ්ල්ස්<br>අර්තාපල් හෝ පරිප්පු<br>කරියක්<br>බිත්තර 2ක් | 3600 |
| සෙනසුරාදා | පාන්<br>පොල් සම්බෝල | බත්<br>ලංකා පරිප්පු<br>බීට් රූට්<br>පලා මැල්ලුමක්<br>බිත්තර 1ක් | බත්<br>කරවල බැදුමක්<br>ගෙඩි එළවලුවක්<br>පලා මැල්ලුමක් | 3600 |

11-98

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2010** | | | |
| නොවැම්බර් | 2010.11.04 | බ්‍රහස්පතින්දා | 2010.10.21 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2010.11.12 | සිකුරාදා | 2010.10.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.11.19 | සිකුරාදා | 2010.11.04 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2010.11.26 | සිකුරාදා | 2010.11.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2010.12.03 | සිකුරාදා | 2010.11.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.10 | සිකුරාදා | 2010.11.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.17 | සිකුරාදා | 2010.12.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.24 | සිකුරාදා | 2010.12.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.31 | සිකුරාදා | 2010.12.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2011** | | | |
| ජනවාරි | 2011.01.07 | සිකුරාදා | 2010.12.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.01.14 | සිකුරාදා | 2010.12.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.01.21 | සිකුරාදා | 2010.01.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.01.28 | සිකුරාදා | 2010.01.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.